## පළමුවන දේව ප්‍රකාශනය

සලමොන්ගේ ප්‍රඥාව 12:13, 16-19

සලමොන්ගේ ප්‍රඥාව නැමති පොතෙන් ගත් පාඨයෙකි.

**"පාපයට පසු මනස්ස්ථාපනය වීම ගැන දෙවියන් වහන්සේ තම දරුවන්ට බලාපොරොත්තුවක් දෙන සේක."**

ඔබ කිසි දාක අසාධාරණ ලෙස විනිශ්චය කෙළෙහි යයි ඔබ විසින් ම ඔප්පු කළ යුතු වූ ද, සියල්ල ගැන සලකන්නා වූ ද ඔබ හැර අන් දෙවි කෙනෙක් නැත. ඔබේ යුක්තියේ මුල රඳා ඇත්තේ බලයෙහි ය. සියල්ලන් කෙරෙහි ආධිපත්‍යය ඔබට ඇති බැවින් ඔබ සියල්ලන්ට කාරුණික ය. ඔබේ අධිපති බලය ගැන ප්‍රශ්න කරන විට ඔබ තමන් ශක්තිය පෙන්වන සේක. මේ බව දන්න අයගේ අහංකාරය ඔබ අනාවරණය කරන සේක. එහෙත්, ඔබ තමන් බල මහිමය පාන විට විනිශ්චයේ දී මෘදු ය. ඔබ ඉතා කාරුණික ව අප පාලනය කරන සේක. මන්ද, ඔබ කැමැත්ත පෙන්වන විට ඔබේ බලය එහි ඇත්තේ ය. ඔබ මෙසේ ක්‍රියා කිරීමෙන් දැහැමි මිනිසා සිය අසල්වැසියන්ට කෙසේ කාරුණික ව සිටිය යුතු දැ යි ඔබ තමන් සෙනගට පාඩමක් උගන්වා ඇත. පාපයට පසු මනස්ස්ථාපනය වීම ගැන මනා බලාපොරොත්තුවක් ඔබ තමන් දරුවන්ට දුන් සේක.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 86:5-6, 9-10, 15-16

පිළිතුර: සමිඳුනි, යහපත් වූ ඔබ අපට කමා කරන සේක.

ගීය: මාගේ සමිඳුනි, ඔබ යහපත් ය, ඔබ කමා කරන සේක; ඔබට අයැදින සියල්ලන්ට තිර පෙම බහුල ව ප්‍රදානය කරන සේක. සමිඳුනි, මාගේ අයැදුමට සවන් දුන මැනව. පිහිට පතමින් මා කරන අයැදුමට කන් දුන මැනව.

මාගේ සමිඳුනි, ඔබ මැවූ සියලු ජාතීහු ඔබ වෙත පැමිණ ඔබට නමදින්නෝ ය. ඔව්හු ඔබේ නාමය පසසමින් ඔබට ගරු කරන්නෝ ය. ඔබ බලසම්පන්න ය, අරුම පුදුම දේ කරන සේක. ඔබ පමණක් දෙවිඳාණෝ ය.

මාගේ සමිඳුනි, ඔබ මෙත් සිත් ඇති දයානුකම්පාව පාන දෙවිඳාණෝ ය, ඉවසන සුලු, කරුණාවෙන් සහ විශ්වාසවන්තකමින් සපිරි තැනැන් වහන්සේ ය. මා වෙත හැරී මට අනුකම්පා කළ මැනව; මා ශක්තිමත් කොට මා ගැළෙවුව මැනව.

## දෙවන දේව ප්‍රකාශනය

රෝම 8:26-27

පාවුලු තුමන් විසින් රෝමවරුන්ට ලියන ලද හසුනෙන් කොටසකි.

**මවා ඇති මේ සක්වල වුව ද දේව පුත්‍රයාණන්ගේ පහළවීම අධික ආශාවෙන් පුල පුලා බලා සිටියි.**

එලෙස ම ශුද්ධාත්මයාණන් වහන්සේත් අපගේ දුර්වලකමේ දී අපට ආධාර දෙන සේක. නිසි ලෙස යාච්ඤා කළ යුත්තේ කෙසේ ද යි අපි නොදනිමු. එහෙත් ශුද්ධාත්මයාණන් වහන්සේ ම වචනවලින් කිය නොහැකි අපේ සුසුම්ලෑම්වල දී දෙවියන් වහන්සේ වෙත අප වෙනුවෙන් අයැදින සේක. අප සිත්සතන්හි ඇති සියල්ල විමසා බලන දෙවියන් වහන්සේ ශුද්ධාත්මයාණන්ගේ අයැදුම් දන්නා සේක. මන්ද, ශුද්ධාත්මයාණන්, සැදැහැවතුන් උදෙසා කරන අයැදුම් දේව අදහසට එකඟ වන බැවිනි.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## සුපුවත් ජය නද

මතෙව් 11:25

ආලේලූයා! ආලේලූයා

"ස්වර්ගයටත්, පොළොවටත් ස්වාමීන් වන පියාණන් වහන්ස, ඔබ වහන්සේ මේ කරුණු පැණවතුන් හා නැණවතුන් කෙරෙන් ආවරණය කොට, බාලයන්ට අනාවරණය කළ හෙයින් ඔබ වහන්සේ ට ස්තුති වේවා. ආලේලූයා!

## ශුද්ධවූ සුවිශේෂය

මතෙව් 13:24-43

මතෙව් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**"අස්වැන්න නෙලන කාලය වන තුරු තිරිඟු හා කිරිඳි වැඩෙන්නට ඉඩ හරින්න."**

ජේසුස් වහන්සේ තවත් උපමාවක් මෙසේ වදාළ සේක: "ස්වර්ග රාජ්‍යය හොඳ බීජ වපුළ මිනිසෙකුට සමාන ය. මිනිසුන් නිදා සිටිය දී ඔහුගේ සතුරා අවුත් තිරිඟු අතර කිරිඳි වපුරා ගියේ ය. තිරිඟු පැල නැඟී, කරල් හටගත් කල කිරිඳිත් මතු විය. එවිට ගෘහ මූලිකයාගේ දාසයෝ අවුත්, 'ස්වාමීනි, ඔබේ කෙතෙහි ඔබ හොඳ බීජ වපුළා නොවේ ද? එසේ නම් කිරිඳි කොහෙන් ද'යි ඔහුගෙන් ඇසූ හ. 'මෙය සතුරෙකුගේ වැඩක් ය'යි ඔහු කී ය. එවිට දාසයෝ කතා කොට, 'එසේ නම්, අප ගොස් ඒවා උදුරා දමන්න ද'යි ඔහුගෙන් ඇසූ හ. එහෙත්, ඔහු උත්තර දෙමින්, 'එසේ නොකරන්න. ඔබ කිරිඳි උදුරද්දී ඒ සමඟ තිරිඟුත් ඉදිරෙන්නට පුළුවන. ගොයම් කපන කාලය දක්වා දෙවගේම එකට වැඩෙන්න හරින්න. ඉන්පසු ගොයම් කපන කාලයේ දී පළමු කොට කිරිඳි එකතු කොට දවන පිණිස මිටි බඳින්න. තිරිඟු මාගේ අටුවේ රැස් කරන්නැ යි කපන්නන්ට කියමි'යි කීවේ ය."උන් වහන්සේ ඔවුන් ඉදිරියෙහි තවත් උපමාවක් වදාරමින්, "ස්වර්ග රාජ්‍යය මෙබඳු ය. එක්තරා මිනිසෙක් සිය කෙතෙහි අබ ඇටයක් වපුළේ ය. එය සියලු ම බීජවලට වඩා කුඩා වුවත්, වැඩුණු කල හැම පලා වර්ගවලට වඩා විශාල වී, අහසේ කුරුල්ලන් අවුත් එහි අතුවල ලැගුම් ගන්න තරම් ලොකු ගසක් වන්නේ ය"යි කී සේක. උන් වහන්සේ තවත් උපමාවක් වදාරමින්, "ස්ත්‍රියක විසින් පිටි නැළි තුනක් සහමුලින් ම පිපෙන තුරු එහි දමන ලද මුහුන් පිඩකට ස්වර්ග රාජ්‍යය සමාන ය"යි කී සේක. ජේසුස් වහන්සේ මේ සියල්ල ජනකායට උපමා මගින් පැවසූ සේක. උපමාවක් නැති ව කිසිවක් ඔවුන්ට නොවදාළ සේක. මෙසේ වූයේ: "මම උපමා මගින් කතා කරමි, ලෝකයේ මුල සිට ම රහස් ව තිබුණු දේ හෙළි කරන්නෙමි"යි දිවැසිවරයන් ලවා පවසන ලද කරුණු ඉටු වන පිණිස ය. එවිට උන් වහන්සේ ජනකාය යන්න හැර ගෙට වැඩිය සේක. ශ්‍රාවකයෝ උන් වහන්සේ වෙත අවුත්, "කෙතේ කිරිඳි පිළිබඳ උපමාව අපට පහදා දුන මැනව"යි කී හ. උන් වහන්සේ උත්තර දෙමින්, මෙසේ වදාළ සේක: "හොඳ බීජ වපුරන තැනැත්තේ නම්, මනුෂ්‍ය-පුත්‍රයාණෝ ය; කෙත නම් ලෝකය ය; හොඳ බීජ නම් රාජ්‍යයට අයිති අය ය; කිරිඳි නම් නපුරාට අයිති අය ය. ඒවා වපුළ සතුරා නම් යක්ෂයා ය; කපන කාලය නම් යුගාන්තය ය; කපන්නෝ නම් දේව දූතයෝ ය. කිරිඳි එක් කොට ගින්නෙහි දවන්නේ යම් සේ ද, යුගාන්තයේ දී එසේ ම වන්නේ ය. මනුෂ්‍ය-පුත්‍රයාණෝ ස්වකීය දූතයන් එවන සේක. ඔව්හු උන් වහන්සේගේ රාජ්‍යයේ බාධා උපදවන සියල්ල ද අදමිටුකම් කරන්නන් ද එක් කොට, ගිනි උදුනෙහි හෙළන්නෝ ය. එහි දී වැලපීම ද දත්මිටි කෑම ද වන්නේ ය. එකල දැහැමි අය තම පියාණන් වහන්සේගේ රාජ්‍යයෙහි සූර්යයා මෙන් බබළන්නෝ ය. සවන් ඇත්තෝ සවන් දෙත් වා!"

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.lk/ වෙත පිවිසෙන්න.